# අමුතු දන්සල



R. වෙනුක්ෂි රමේෂා ගුණරත්න

ප්‍රථම මුද්‍රණය : **2025.02.08**

කර්තෘ : **R. වෙනුක්ෂි රමේෂා ගුණරත්න**

ලිපිනය : **නො.66/31 A, රජපිහිල්ල මාවත,**
**මහනුවර.**

ISBN අංකය : **is37254**

මුද්‍රණය :
**“PRESS”**
**නො.24, කොටුගොඩැල්ල වීදිය,**
**මහනුවර.**

# පිදුම

කන්ද උඩරට සෙංකඩගල පුර ශ්‍රී

දළදා සමිඳු අභියස රැදෙන.......

මහමායා බාලිකා විදු පියසේ සිප්

සතර හදාරන මා.......

මාගේ ආදරණීය දෙමව්පියන් සහ

සිප්සතර ලබාදෙන මාගේ

ආදරණීය

ගුරු මෑණිවරුන්ට සහ

පියවරුන්ට,

මාගේ ආදරණීය සහෝදරියන්ට

මෙම පොත පිළිගන්වමි !

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතා කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "**හෙරණගත්කරණී**" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

වෙසක් සමය එලැඹුනි. හැමදෙනාම වෙසක් කූඩු, තොරන් සාදමින් වෙසක් දවසට ලක ලෑස්ති වූහ. රතු, කොළ, කහ, නිල් අටපට්ටම් සෑදෙන අතරේ නෙළුම් මල් ද දහ අට පට්ටම්ද අහළ පහළ ගෙවල් වල සාදන්නට වූයේ වෙසගෙහි ලස්සන තව තවත් වැඩි කරන්නට සැරසෙන්නාක් මෙනි.



දන්සල් වෙනුවෙන් අධාර එකතු කොට ඒ වෙනුවෙන් සෑම වෙසක් සමයේ ම කැපවී කටයුතු කරන කණ්ඩායම් දන්සල වෙනුවෙන් ඉඩකඩ ඇති තැන් සොයා බලා ඒ තැන් ලක ලෑස්ති කරමින් අඩුපාඩු සොයා බලමින් සියල්ලටම පහසුකම් සලස්වන්නට දැඩිසේ වෙහෙස වන්නේ පැමිණෙන ජනතාවගේ සුවපහසුව වෙනුවෙනි.



මේ අතර ආක්ෂා නංගිට ද දන්සලක් දීමට ආසවක් ඇති වුණා ය. ''අම්මා මට දන්සලක් දෙන්න ඕනෑ.'' නංගි දුවගෙන ගොස් අම්මාට කීවා ය. ''අනේ මගේ දුවේ එච්චර ලොකු වැඩක් අපට තනිව ම කරන්න කොහොමත් ම බෑ.'' ආක්ෂා නංගිගේ අම්මා නංගිට ආදරයෙන් තේරුම් කර දුන්නා ය. නංගි එය පිළිගෙන අම්මාට කරදර නොකොට මිදුලට ගියා ය.




මිදුලේ ඒමේ අත දුවමින් සෙල්ලම් කරමින් සිටි නංගිට බිම ඒමේ අත කෑම සොයා දුවන කූඹියන් දෙස බලමින් එතැන බිම වාඩි වුණා. එක් කූඹියෙක් පාන් කෑල්ලක් අරන් හනි හනිකට දුවද් දී තවත් කූඹියන් දෙතුන් දෙනෙක් ඊටත් වඩා ලොකු පාන් කැබැල්ලක් අරන් ගුල වෙත අමාරුවෙන් යමින් සිටියහ.



සමඟියෙන් කඩිසර කමින් තම තමන්ගේ එදිනෙදා කටයුතු කර ගන්නා අයුරු ඇය ඉතා ආසාවෙන් බලා සිටියා ය. එකමුතු කමින් කළ හැකි දේ කොතරම් ද ඇය තනිව ම සිතුවා ය.

පෙරහැරක් වගේ කූඹියෝ
සමගියෙන් වැඩ කූඹියෝ
වෙහෙසකුත් නැති කූඹියෝ
අලසකම් නැති කූඹියෝ



නංගි හිතට ආව විදිහට කවියකුත් කිවුවා ය. ඒ අතර සීනි ඇටයක් දෙකක් අරන් දුවන කූඹියන් දැක නංගිට අමුතු අදහසක් ආවේ ය.



නංගි ගෙට දුවන් ගියේ ඉතා වේගයෙන් ''අම්මා'' කියා කෑ ගසමිනි. ''අම්මා... අම්මා... මම දන්සලක් දෙනවා.'' කෑ ගසමින් දුව එන නංගි දෙස අම්මා බලා සිටියේ කිසිවක් සිතා ගත නොහැකිවයි. ''අම්මා... තාත්තා... එන්න මගේ දන්සලට.'' නංගි වෙන කිසිවක් නොකී නිසා ආක්ෂා නංගිගේ අම්මා ද ඒ ගැන අහන්න නොගියා ය.



වෙසක් දා එළැඹුනි. නංගි දන්සලට සූදානම් විය. තනිව ම දෙන මේ දන්සලට ආරාධිත අමුත්තන් වූයේ අම්මා, තාත්තා පමණි. ඇතුල් වීම, පිට වීම කියා බෝඩ් දෙකක් ගසා කොටු කළ තැනකට සීනි ටිකක් දමන්න යැයි නංගී ආරාධිත අමුත්තන්ට ආරාධනා කළා. කිසිවක් තේරුම් නොගත් අම්මා සහ තාත්තා ඒ ඉල්ලීම ඉටු කළේ ඇගේ සිත රිදවීමට අකමැති වූ නිසාවෙනි.



ඇගේ දන්සලට සුළු මොහොතකින් එකා දෙන්නා එකතු වන්නට වූහ. ඒ වෙන කිසිවෙක් නොව කූඹින් ය. ඇතුල් වීම, පිට වීම කියා තිබුණ ද පළමුව පිළිවෙලකට ආ කූඹි පිරිවර පසුව යන එන තැන් ගැන වගක් නොවිනි. ඒත් දන්සල නම් සීනි ඉවර වෙනවාත් සමඟම නිමා වුණේ ය.



එම දන්සල කුඹින්ගේ දන්සල වුව ද දැක නොතිබූ අමුතු දන්සලක් වූ නිසා ආක්ෂා නංගිගේ දන්සල **අමුතු දන්සල** නම් විය.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට අල්බක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්නයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තරබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්.

ISBN අංකය : is37254